# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.11.29

වේලාව : ප.ව. 02.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

1) එම්.ඒ.බී. දයා සෙනරත් මයා - ප්‍රධාන ලේකම් (බ.ප).

2) හේමන්ත සමරකෝන් මයා - සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).

3) චන්ද්‍රානි සමරකෝන් මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).

4) ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).

5) එන්.නිල්වල මයා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).

6) එම්.කේ.කේ.ආර්.අබේදීර මිය - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප).

7) කේ.කේ. චම්පිකා කනේරු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).

8) සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).

9) බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).

10) ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).

11) ඩී.එම්.එන්.දිසානායක මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්).

12) යූ.ඩබ්ලිව්.ටී.යූ. රාජකරුණා - සහකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප).

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ රථ වාහන ගාල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හා ඒ සඳහා තෝරා ගත් විකල්ප ස්ථාන සම්බන්ධව අධීක්ෂණය කර, සැකසූ කමිටු වාර්තාව ඊළඟ රැස්වීමේ දී ඉදිරිපත් කිරීම. | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම. | තාක්‍ෂණ නිලධාරි සහ තාක්‍ෂණ සහකාර තනතුර සඳහා පුවත්පත් දැන්වීමක් පල කිරීම හා දෙසැම්බර් මස අවසන් සතිය වන විට අයදුම්පත් භාර ගැනීම අවසන් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 03. | නව වාහන මිල දී ගැනීම. | ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද වාහන පිළිබඳ විස්තර 2016.11.30 දින පැවැත්වීමට නියමිත වාහන කමිටුව වෙත යොමු කර, එහි වාර්තාවක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදි කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම.<br><br>ඉදි කිරීමට නියමිත නව නිල නිවාසයක ඇතුළත් විය යුතු මූලික අංග පිළිබඳ ව අදහස් ඉදිරිපත් වූ අතර, එක් නිවෙසක සැලැස්ම සකස් කර, ඊළඟ රැස්වීමේ ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.<br><br>අනුරාධපුර, නුවරඑළිය සහ කතරගම යන ප්‍රදේශ වල සංචාරක බංගලා ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමට සංශෝධිත පුවත්පත් දැන්වීම පල කිරීම සඳහා ඉදිරි කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |

| | | | |
|---|---|---|---|
| 05. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මට්ටමින් ආංශික සැලැස්ම සකස් කර දෙසැම්බර් 20ට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.<br><br>පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) ව්‍යාපෘති සඳහා යෝජනා දෙසැම්බර් 31ට පෙර සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සඳහා යෝජනා පෙබරවාරි 01ට පෙර ඉදිරිපත් කිරීම.<br><br>ව්‍යාපෘති අනුමත කිරීමේ දී එම ව්‍යාපෘති වල අදාළත්වය, ඵලදායීතාව සහ මුදලට වටිනාකම යන නිර්ණායක කෙරෙහි සැලකිලිමත් වීම හා ගැටළු සහගත වැඩසටහන් පවතී නම්, ඒවා සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 06. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | පළාත් සභාවේ භාෂා පරිවර්තකයන්ගේ පුරප්පාඩු 18 සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම.<br><br>සභා ලේකම් කාර්යාලය, ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන හා මූල්‍ය අංශයේ වෙබ් පිටුව ත්‍රෛ භාෂාවෙන් තොරතුරු යාවත්කාලීන කිරීමේ අඩුපාඩු දෙසැම්බර් 15 වන විට අවසන් කිරීම. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු නිලධාරීන් නම් කර එවන මෙන් දන්වා යවා ඇති නමුත්, තවමත් නාමයන් ඉදිරිපත් නොකළ පහත සඳහන් අමාත්‍යාංශ වලට අයත් ආයතන වල විස්තර ඉක්මනින් එවීමට කටයුතු කිරීම.<br>● පළාත් පාලන අමාත්‍යාංශය<br>● සෞඛ්‍ය අමාත්‍යාංශය<br>● අධ්‍යාපන අමාත්‍යාංශය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>අදාළ අමාත්‍යාංශ ලේකම්වරු |
| 08. | E-recording (SLT Server / Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | බස්නාහිර පළාතේ ආයතන වලින් ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්‍ෂණය යොදාගැනීම පිළිබඳ මඟ පෙන්වීම සඳහා වන කමිටු වාර්තාව, දෙසැම්බර් 03 වන විට ඉදිරිපත් කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන් |
| 09. | "ජනපතිට කියන්න" වැඩසටහන | "ජනපතිට කියන්න" වැඩසටහන යටතේ 2016.11.29 දින පරිගණක වැඩසටහන් වාර්තාවට අනුව, පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලැබී ඇති ගැටලු 199න් 6ක් සඳහා විසඳුම් ලබා දී ඇති බව සඳහන් වුවත්, පළාත් පාලන ලේකම්ගේ වාර්තාවට අනුව, ගැටලු 192න් 47ක් සඳහා විසඳුම් ලබාදුන් බව ප්‍රකාශ කරන ලදි. එබැවින්, විසඳුම් ලබා දී ඇති නමුත් වැඩසටහනේ යාවත්කාලීන නොකළ ගැටලු වහාම යාවත්කාලීන කිරීම හා වහාම ප්‍රගතිය වාර්තා කිරීම. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| | | | |
| 10. | සංග්‍රහ දීමනා වැඩි කිරීම. | ලේකම්වරුන්ට ගෙවනු ලබන සංග්‍රහ දීමනාව ඉහල දැමීම සඳහා පත් කළ කමිටුවේ වාර්තාව සෞඛ්‍ය අමාත්‍යාංශය ලේකම් විසින් ඉදිරිපත් කළ අතර, එය දීමනා කමිටුව වෙත යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11. | බස්නාහිර පළාත් විගණන විමසුම සම්බන්ධ ආණ්ඩුකාර ලේකම් විසින් යොමු කරන ලද ලිපිය. | ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් දෙසැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිත විගණන විමසුම් සම්බන්ධ රැස්වීම සඳහා සූදානම් වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදි. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලු ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය ආයතන තුල අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් කිරීම. | සෑම අමාත්‍යාංශයකට ම අභ්‍යන්තර විගණන ඒකකයක් ඇති කිරීම සඳහා ප්‍රධාන ලේකම් යටතේ ඇති අභ්‍යන්තර විගණන ඒකකයේ පුරප්පාඩු 13 සඳහා විගණන නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව නිලධාරීන් දෙදෙනෙකු බැගින් එම අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | "නිලධාරීන් සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි සඳහා තෝරා ගැනීම් නිර්ණායක හා මුදල් වෙන් කිරීමේ විධිමත් ක්‍රියා පටිපාටියක් සැකසීම" යන මැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද WPH/A12/2/16 අංක හා 2016.11.28 දිනැති ලිපිය | නිලධාරීන්ගේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි සඳහා මුදල් වෙන් කිරීමේ දී එය සේවා ව්‍යවස්ථාව සමඟ ගැළපීම, අවශ්‍යතාව, නිවාඩු පිළිබඳ විස්තර ආදී සියලු විස්තර සමඟ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවත්, මේ සඳහා විධිමත් කමිටුවක් දැනටමත් ස්ථාපිත බැවින්, ඒ අනුව කටයුතු කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 03. | 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය | එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන වැඩසටහනේ මූලික අපේක්ෂාව වන " දිළිඳුකමින් ජනතාව නිදහස් කර ගැනීමේ" අරමුණ පෙරදැරිව අතිගරු ජනාධිපතිතුමන් විසින් "2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව ප්‍රධාන ලේකම් විසින් ලේකම්වරුන් දැනුවත් කරන ලදී.<br>එබැවින්, 2017 නව සංවර්ධන යෝජනා සැලසුම් කිරීමේ දී උක්ත කරුණ සැලකිල්ලට ගැනීම හා ජනවාරි 8 දින යෝජනා ක්‍රියාවට නැංවීමට අවශ්‍ය බැවින්, එක් එක් දෙපාර්තමේන්තු යටතේ දිළිඳුකම පිටුදැකීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන එක් වැඩසටහනක් බැගින් සැලසුම් කර, දෙසැම්බර් 22ට ප්‍රථම ප්‍රධාන ලේකම් වෙත එවීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |